# 2 ශ්‍රේණිය සිංහල

## පෙළ පොත අභ්‍යාස සහ පිළිතුරු 01

### වැව් ඉවුරේ

### සංගීත පන්තිය

පාලිත

(Dip. In Sci. N.I.E./O.U.S.L.)



Face Book 3in1 Youtube 3 in 1 Online
Class Details WhatsApp 071-9020298

# 1. වැව් ඉවුරේ සංගීත පන්තිය

යාළුවෝ වැව් ඉවුරට ආවා.

"අද අපි මොනව ද කරන්නේ?"

ජානක ඇසුවා.

"සංගීත පන්තියක් දමමු." පවනි කිවුවා.

හැමෝම කැමති වුණා.

"මම ගුරුතුමී වෙන්නම්." මලී අක්කා කිවුවා.



“හෝ ගාලා රැලි එනවා. වැව අද මුහුද වගේ.”

කසුන් කිවුවා.

“මුහුදෙ නම් ලොකු නැව් යනවා නේද?”

පවනි නංගි ඇහුවා.

“ඔව්, ඔව්,” කවුරුත් හයියෙන් කිවුවා.

“මට ආසයි නැවක යන්න.” කෝසල කිවුවා.

“ළමයි, දැන් අපි රවුමට වාඩි වෙමු. මුහුද ගැන සින්දුවක් කියමු.”

**මුහුද ලස්සනයි**
**මුහුද හරි ලොකුයි**
**හො හෝ හො හෝ හො හෝ හෝව**
**නතර වෙන්නෙ නෑ**
**රැල්ල ඇදෙනවා**
**වැල්ලෙ වැදෙනවා**
**සමන් මොට්ටු වගේ වතුර බිංදු ඉහෙනවා**



“ මම දන්නවා සරුංගලය ගැන සින්දුවක්. කියන්න ද?” කෝසල ඇහුවා.

සුළං සැරේ වංගු හැරී
දුර අහසේ දාංගලේ
මහන්සියට ගහ මුදුනේ
හැංගුණා ද සරුංගලේ

“හරිම ලස්සනයි. අපි හැමෝම තාලෙට කියමු.”

“ හැන්දෑ වෙන්න ළඟයි. අපි දැන් ගෙදර යමු.”

“ හෙට අපි සරුංගල් යවමු ද?” පවනි ඇහුවා.

හැමෝම කැමති වුණා.

යාළුවෝ සින්දු කිය කියා,

කෝච්චියක් වගේ පේළියට ගෙදර ගියා.



# 1. වැව් ඉවුරේ සංගීත පන්තිය

පින්තූරය බලා ගැළපෙන වාක්‍යවලට හරි නම් ✓ ලකුණ ද වැරදි නම් ✗ ලකුණ ද යොදන්න.



1. පින්තූරයේ වැවක් තියෙනවා. ☐
2. ළමයි ඔංචිලි පදිනවා. ☐
3. වැවේ ඔරුවක් යනවා. ☐
4. ලොකු ගහක් තියෙනවා. ☐
5. ළමයි පස්දෙනෙක් ඉන්නවා. ☐

පාඩම කියවන්න. සුදුසු වචන තෝරා හිස්තැන් පුරවන්න.

(වැව්, සරුංගල්, කෝච්චියක්, නැව්, බිංදු, සින්දු,)

1. යාළුවෝ ____________ ඉවුරට ආවා.

2. මුහුදේ ලොකු ____________ යනවා.

3. අපි ____________ යවමු.

4. සමන් මොට්ටු වගේ වතුර ____________ ඉහෙනවා.

5. අපි හැමෝම ____________ කියමු.

6. යාළුවෝ ____________ වගේ පේළියට ගෙදර ගියා.



# පිළිතුරු

## Answer



# 1. වැව් ඉවුරේ සංගීත පන්තිය

පින්තූරය බලා ගැළපෙන වාක්‍යවලට හරි නම් ✓ ලකුණ ද වැරදි නම් ✕ ලකුණ ද යොදන්න.



| | | |
|---|---|---|
| 1. | පින්තූරයේ වැවක් තියෙනවා. | ✓ |
| 2. | ළමයි ඔංචිලි පදිනවා. | ✕ |
| 3. | වැවේ ඔරුවක් යනවා. | ✕ |
| 4. | ලොකු ගහක් තියෙනවා. | ✓ |
| 5. | ළමයි පස්දෙනෙක් ඉන්නවා. | ✓ |

පාඩම කියවන්න. සුදුසු වචන තෝරා හිස්තැන් පුරවන්න.

(වැව්, සරුංගල්, කෝච්චියක්, නැව්, බිංදු, සින්දු,)

1. යාළුවෝ වැව් ඉවුරට ආවා.

2. මුහුදේ ලොකු නැව් යනවා.

3. අපි සරුංගල් යවමු.

4. සමන් මොට්ටු වගේ වතුර බිංදු ඉහෙනවා.

5. අපි හැමෝම සින්දු කියමු.

6. යාළුවෝ කෝච්චියක් වගේ පේළියට ගෙදර ගියා.



අප උපකාරක පංතියේදී ලබා දෙන මෙම නිබන්ධනය ද ඇතුලු මෙවැනි නිබන්ධන රාශියක් pdf ලෙස 3in1 Group එකෙන් ලබා ගත හැක.

සුවහසක් ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටින දරුවන් වෙනුවෙන් වාණිජ අරමුණකින් තොරව සතුටින් ලබා දෙන නිබන්ධන නම වෙනස් කර අලෙවි කිරීමට කටයුතු නොකරන්න. පාසල් හෝ උපකාරක පංති සඳහා යොදා ගත හැකිය. ඔබ විසින් ලබා දෙන Like එක Comment එක අපට ශක්තියකි.

අප 3in1 Youtube නාලිකාවෙන් ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු සාකච්ඡා කිරීම නැරඹිය හැකිය.

ස්තූතියි !

**හසිත හෙට්ටිආරච්චි**

**(Dip. In Sci. N.I.E./O.U.S.L.)**



3 in 1 youtube නාලිකාව ඔස්සේ නැරඹිය හැකිය.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

එක් කණ්ඩායමකට සිසුන් 10ක් පමණක් බඳවා ගැනේ